| කුරුණෑගල | 1,4,5,6,7,9,12,14,17,20,25,27,30,32,33,36,37,39,40,42,43,44,45,46,49,52,57,59,60,61,63,65,68,74,77 |
| කෑගල්ල | 3,5,6,7,9,10,12,12.1,14,16,17,20,22,25,30,32,33,40,52,55,57,60,61,63,65,68,74,77 |

| දිස්ත්‍රික්කය | පාඨමාලා අංකය |
|---|---|
| පුත්තලම | 6,7,9,10,12,12.1,13,14,16,17,20,22,25,26,27,32,33,37,40,45,52,55,57,60,61,63,64,68,77 |
| හම්බන්තොට | 1,4,5,6,7,9,10,11,12,12.1,13,14,17,20,22,25,27,32,33,37,40,42,44,45,47,52,55,57,60,61,63,64,68,77 |
| රත්නපුර | 6,7,9,10,12,12.1,13,14,16,17,20,25,29,32,33,37,40,42,43,44,45,47,52,57,60,61,77 |
| අම්පාර | 3,6,7,9,10,12,12.1,13,14,16,17,19,20,22,25,26,27,32,33,37,40,44,45,47,49,52,57,60,61,63,64,74,77 |
| මඩකලපුව | 6,7,11,13,16,20,32,33,40,45,47,57,60,61,63,77 |
| නුවරඑළිය | 6,7,9,12.1,14,16,17,19,20,25,26,27,32,33,35,37,40,45,49,55,57,60,74,77 |
| කොළඹ | 1,4,6,7,9,10,12,12.1,17,20,22,25,29,32,33,35,37,41,44,45,47,52,57,58.1,60,61,63,65,74,77 |
| යාපනය | 6,7,9,11,12,12.1,16,17,20,22,25,26,27,32,33,35,37,40,45,52,57,60,61,63,76,77 |
| කිලිනොච්චිය | 6,7,11,12,12.1,16,17,20,32,33,36,40,41,45,52,57,60,61,63,68,74,76,77 |
| වව්නියා | 6,7,12.1,17,20,22,32,33,40,45,52,57,60,61,63,73,77 |

**ආදර්ශ අයදුම්පත්‍රය**

***ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු අධිකාරිය***

*2018 පළමු අර්ධ වර්ෂය සඳහා ආධුනිකයන් බඳවා ගැනීම*

1. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——————————————————.
2. ලිපිනය :——————————————————.
3. පදිංචිය :——————————————————.
   i. ග්‍රාමසේවා වසම :——————————————————.
   ii. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————————————————.
   iii. දිස්ත්‍රික්කය :——————————————————.
4. දුරකතන අංකය :——————————————————.
5. උපන් දිනය :——————————————————.
6. ජාතික හැඳුනුම්පත් අංකය :——————————————————.

   ලබා ඇති ඉහළම අධ්‍යාපන සුදුසුකම :——————————————————.

7. ඔබගේ රුචිකත්වය හා සුදුසුකම් අනුව හැදෑරීමට කැමති පාඨමාලා හා මධ්‍යස්ථාන අනුපිළිවෙලින් සඳහන් කරන්න.

| පාඨමාලාව | අදාළ මධ්‍යස්ථානය |
|---|---|
| i. | i. |
| ii. | ii. |
| iii. | iii. |

ඉහත තොරතුරු නිවැරදි හා සත්‍ය බවට සහතික කරමි.

———————,
අයදුම්කරුගේ අත්සන

දිනය :————.

* ඔබගේ අයදුම්පත පාඨමාලාව තෝරාගත් දිස්ත්‍රික්කයේ සහකාර අධ්‍යක්ෂගේ ලිපිනයට 2017.12.15 වැනි දිනට පෙර යොමු කරන්න.

11-1459

## ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ -2 සේවා ගණයේ දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර යාන්ත්‍රික සහ දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර විදුලි තනතුරුවල III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2017

1. පහත තනතුරුවල පවතින පුරප්පාඩු සඳහා පුහුණු කාලසීමාවට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය සඳහා සුදුසුකම් ලත් ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

   - දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර යාන්ත්‍රික තනතුරේ පුරප්පාඩු - 154
   - දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර විදුලි තනතුරේ පුරප්පාඩු - 43

2. දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පවත්වනු ලබන ලිඛිත තරඟ විභාගයෙන් අයදුම්කරුවන් ලබා ගන්නා ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණයට යොමු කර, තරඟ විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබා ගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවට බඳවා ගනු ලැබේ.

3. *වයස් සීමාව :*
   ඉල්ලුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ වයස අවුරුදු 45ට නොවැඩි විය යුතුය.

4. *බඳවා ගැනීමේ කොන්දේසි :*
   ප්‍රථමයෙන්ම වසරක පුහුණු කාලසීමාවක් සඳහා බඳවාගෙන, එම පුහුණුව සාර්ථකව නිම කරන නිලධාරීන් III වන ශ්‍රේණියට බඳවාගනු ලැබේ.

   *පුහුණු කාලසීමාවට බඳවා ගැනීම සඳහා සුදුසුකම්-*

   *අධ්‍යාපන සුදුසුකම් :*

   සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එක් වරක දී විෂයන් හයකින් (06) අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.;

   සහ

   අධ්‍යාපන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේ දී විද්‍යා විෂය ධාරාවෙන් සියළුම විෂයයන්ගෙන් (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත්ව තෘතීයික අධ්‍යාපන පාඨමාලාවක් හැදෑරීම සඳහා අවශ්‍ය සාධන මට්ටම ලබා තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ විෂයයන් 03කින් එකවර සමත්ව තිබීම ප්‍රමාණවත් වේ.)

   2017.06.15 දින වන විට ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයේ පුහුණු පාඨමාලා සඳහා ඇතුළත් කරගෙන ඇති පුහුණුලාභීන් සඳහා පමණක් අදළ පාඨමාලා සාර්ථක ලෙස සම්පූර්ණ කිරීමෙන් අනතුරුව ලබා දෙනු ලබන පුහුණු සහතිකය ලබා ඇත්නම් ඉහත අධ්‍යාපන සුදුසුකම් නොසලකා අයදුම් කිරීමට අවස්ථාව ලබා දෙනු ලැබේ.

   **වෘත්තීය සුදුසුකම් :**
   ශ්‍රී ලංකා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයෙන් තනතුරට අදළව පහත සඳහන් ක්ෂේත්‍රයක වසර 2 1/2 කට නොඅඩු පූර්ණ කාලීන කාර්මික පාඨමාලාවක් හදරා සහතික පත්‍ර ලබා ඇති අයෙකු වීම.

   ඩීසල් එන්ජින් යාන්ත්‍රික ශිල්පී පාඨමාලාව
   පැස්සුම් ශිල්පී පාඨමාලාව
   විදුලි ශිල්පී (බල) පාඨමාලාව
   යන්ත්‍ර ශිල්පී (සාමාන්‍ය) පාඨමාලාව

5. වැටුප් පරිමාණය :
   III ශ්‍රේණිය
   රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 03/2016 යටතේ MT-02-2016
   රු. 30,140-10x350-11x370-10x560-10x660-රු. 49,910

**පුහුණු කාල සීමාව**

මාසික දීමනාව : 2018.01.01 - 2018.12.31 දින දක්වා - මාසික දීමනාව (රු. 20,462)
ගැලපුම් දීමනාව (රු. 4,629)

6. **බඳවා ගැනීමේ ක්‍රමය :**

පුහුණු කාල සීමාවට බඳවා ගැනීමේ ලිඛිත විභාගය සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

අයදුම්කරු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු සැපයිය යුතුය.

විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන නීති රීති වලට හා විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීති රීති උල්ලංඝනය කළ හොත් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට සිදුවනු ඇත.

➢ **පුහුණු කාල සීමාවට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ විෂයයන් :**

විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය | පැය 01 | 100 | 40 |
| 02 | තාක්ෂණ විෂය | පැය 02 | 100 | 40 |

විෂය නිර්දේශය :

01. *සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය.*-අපේක්ෂකයා වාසය කරන හා සේවය කරන පරිසරය ඇතුළුව ශ්‍රී ලංකාවේ සමාජ, ආර්ථික, සංස්කෘතික හා දේශපාලනමය දැනුම හා ජාතික හා අන්තර්ජාතික වශයෙන් වැදගත්වන නූතන කරුණු මෙන්ම ඓතිහාසික කරුණු ද, විද්‍යාත්මක, භෞතික හා කාර්මික සංවර්ධනය හා සම්බන්ධ අපේක්ෂකයෙකු සතු දැනුම හා අපේක්ෂකයාගේ තර්කානුකූල විවරණ සහ විග්‍රහ ශක්තිය, නිවැරදි සිද්ධි අනුමානයන්ට එළඹීමේ හැකියාව, සාමාන්‍ය දැනීම හා බුද්ධිය පිළිබඳ මැනීමක් කිරීම අරමුණු කොටගෙන ගණිත ගැටළු, සාමාන්‍ය දැනීම හා පරිසරය ආශ්‍රිත ප්‍රශ්න ඇතුළත් ව්‍යුහගත මාදිලියේ ලිඛිත විභාගයකි.

02. ***තාක්ෂණ විෂය.***-තනතුරට අදළව දැනගත යුතු මූලික තාක්ෂණික න්‍යායික දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

➢ **පුහුණු කාල සීමාවට බඳවා ගැනීමේ යෝග්‍යතා ඇගයීමේ සම්මුඛ පරීක්ෂණය :**

ලිඛිත තරග විභාගයෙන් සමත්වන අයදුම්කරුවන් ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව පවතින පුරප්පාඩු සංඛ්‍යාවේ දෙගුණයකට සමාන අයදුම්කරුවන් සංඛ්‍යාවක් ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයට යොමු කර තරග විභාගයෙන් හා සම්මුඛ පරීක්ෂණයේ දී ලබාගත් ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව අයදුම්පත් කැඳවන අවස්ථාවේ පැවති පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් බඳවා ගනු ලැබේ.

| *ලකුණු ලබා දෙනු ලබන ප්‍රධාන ශීර්ෂ* | *උපරිම ලකුණු ප්‍රමාණය* |
|---|---|
| 1. අතිරේක අධ්‍යාපන සුදුසුකම්<br>හදරා ඇති ඉංග්‍රීසි/දෙමළ භාෂා, පරිඝනක සහ වෙනත් පාඨමාලා | 20 |
| 2. අතිරේක වෘත්තීය සුදුසුකම්<br>වෘත්තීයට අදළව හදරා ඇති වෙනත් වෘත්තීය පාඨමාලා<br>(මාස 06 සහ මාස 06කට වැඩි පාඨමාලා සඳහා ලකුණු ලබා දෙනු ලැබේ.) | 30 |

| | |
|---|---|
| 3. තනතුරට අදළව ලබා ඇති පළපුරුද්ද<br>වසරකට ලකුණු 06 බැගින් උපරිම වසර 05ක් සඳහා සලකා බලනු ලැබේ. | 30 |
| 4. විශේෂ/බාහිර දක්‍ෂතා<br>ක්‍රීඩා/සමාජ සේවා යනාදී | 15 |
| 5. සම්මුඛ පරීක්‍ෂණයේදී දක්වන ලද ආකල්ප හා පෞරුෂය | 05 |
| එකතුව | 100 |

*පුහුණු කාලසීමාවෙන් පසුව III ශ්‍රේණියට බඳවා ගැනීමේ ක්‍රමය :*

පුහුණු කාලය සඳහා බඳවා ගන්නා ලද පුහුණුලාභීන් පුහුණුව අවසානයේදී ලිඛිත හා ප්‍රායෝගික පරීක්‍ෂණයකට යොමු කර සමත් වූ අය III ශ්‍රේණියට පත් කරනු ලැබේ. පළමුවර පුහුණුව අවසන් පරීක්‍ෂණය අසමත් වූ අයට නැවත පැවැත්වෙන පුහුණු අවසන් පරීක්‍ෂණය සඳහා පෙනී සිටීම සඳහා අවස්ථා 02ක් ලබාදෙන අතර අසමත් වන අයගේ සේවය අවසන් කරනු ලැබේ.

*පුහුණු කාල සීමාවෙන් පසු III ශ්‍රේණියට බඳවා ගැනීමේ ලිඛිත විභාගයේ විෂයයන් :*

එක් ප්‍රශ්න පත්‍රයකින් පමණක් සමන්විත වේ.

| | *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|---|
| 01 | තාක්‍ෂණ විෂය | පැය 02 | 100 | 40 |

විෂය නිර්දේශය
තාක්‍ෂණ විෂය - තනතුරට අදළව තාක්‍ෂණ විෂය සම්බන්ධයෙන් දැනුම මැන බැලෙන ආකාරයේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විත වේ.

පුහුණු කාල සීමාවෙන් පසු 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ ප්‍රායෝගික පරීක්‍ෂණය

| | *විෂයයන්* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 01 | තාක්‍ෂණ විෂය | 100 | 60 |

විෂය නිර්දේශය

තාක්‍ෂණ විෂය :- තෝරා ගත් විෂය පිළිබඳ නිපුණතාවය සහ තනතුරට අදළව න්‍යායික දැනුම ප්‍රායෝගිකව හා නිවැරදිව භාවිතයට ගනු ලබන්නේ දැයි මැන බැලීම සඳහා ප්‍රායෝගික පරීක්‍ෂණයක් පවත්වනු ලැබේ.

07. ***සේවා කොන්දේසි :***
මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳව රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයකට යටත් විය යුතුය.)
සෑම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට යටත් වනු ඇත.

සේවා ගිවිසුම පිළිබඳ විස්තර :

පුහුණු කාලසීමාවට බඳවා ගෙන III ශ්‍රේණියට පත් කරනු ලබන නිලධාරීන් III ශ්‍රේණියට පත්වීම ලද දින සිට වසර 10 ක කාලයක් අනිවාර්යයෙන් ම දුම්රිය දෙපාර්තමේන්තුවට සේවය කළ යුතුය. එසේ වසර 10 ක සේවයට පෙර ඉවත්ව නොයන බවටත් ඊට පෙර සේවයෙන් ඉවත්ව යන්නේ නම් දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් නිර්දේශ කරනු ලබන මුදලක් දෙපාර්තමේන්තුවට ගෙවීමට එකඟ බවටත් රජයේ සේවකයෙකු ඇපකරුවෙකු වශයෙන් ඉදිරිපත් කර වගකීමකට බැඳිය යුතුය.

III වන ශ්‍රේණියට බඳවා ගෙන වසර 03 ක් ගතවීමට පෙර 1 වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත්විය යුතුය. රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධාරීන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාව පරිවාස කාලය තුළ ලබා ගත යුතුය.

තෝරා ගනු ලබන්නන් රාජ්‍ය සේවයේ පත්වීම් පාලනය කෙරෙන පොදු කොන්දේසිවලට ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක -: PSC/EST/04 -01-43/09/2016 හා 2017.06.15 දිනැතිව අනුමත ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමණාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ 2 සේවා බණ්ඩය සඳහා බඳවා ගැනීමේ පරිපාටියෙහි පනවා ඇති නියමයන් හා කොන්දේසි වලටද, එම පරිපාටියට කර ඇති හෝ මින්මතු කරන සංශෝධනවලටද, ආයතන සංග්‍රහයේ හා මුදල් රෙගුලාසි විධි විධාන වලටද, අංක 1589/30 හා 2009.02.20 වැනි දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කාර්ය පටිපාටික රීතිවලටද, දෙපාර්තමේන්තු නියෝග හා රෙගුලාසිවලටද යටත් විය යුතුය.

තෝරාගනු ලබන්නන් නියමිත වෛද්‍ය පරීක්ෂණයෙන් සමත් වීමට අමතරව දුම්රිය දෙපාර්තමේන්තු උපදෙස් මාලාවට අනුව, තනතුරට අදළව සමත්විය යුතු විශේෂ දෘෂ්ඨි පරීක්ෂණයෙන් ද සමත් විය යුතුය.

08. ***ව්‍යාජ තොරතුරු සඳහා දඬුවම් :***

ඉල්ලුම්පත්‍රය පිරවීමේ දී ඉතා සැලකිලිමත්ව නිරවද්‍ය තොරතුරු සැපයිය යුතුය. මේ විභාගයේ නීතිරීති අනුව යම් අයදුම්කරුවෙකු නුසුදුසු බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද් දී හෝ විභාගයෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවකදී ඔහුගේ/ඇයගේ අපේකෂකත්වය අවලංගු කළ හැකිය. අයදුම්කරුවෙකු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඕනෑම අවස්ථාවක අසත්‍ය බව පෙනී ගිය හොත් හෝ ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට පිළිවන. අයැදුම්කරුවෙකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

09. ***විභාග ගාස්තුව :***

විභාග ගාස්තුව රු. 750.00 කි. මෙම මුදල අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට දුම්රිය සාමාන්‍යාධිකාරීගේ මහජන බැංකු නගර මධ්‍ය ශාඛාවේ ගිණුම් අංක 176-100129027-313 ට බැරවෙන පරිදි ඕනෑම මහජන බැංකු ශාඛාවකට ගෙවිය හැකිය. ඒ සඳහා නිකුත් කරන රිසිට් පත අයැදුම්පතේ අදළ කොටුවේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. (රිසිට්පතේ ඡායාස්ථ පිටපතක් මතු ප්‍රයෝජනය සඳහා ළග තබා ගත යුතුය.) කිසිම හේතුවක් නිසාවත් විභාග ගාස්තු ආපසු ගෙවනු නොලබන අතර මුදල් ඇණවුම් හා මුද්දර භාර ගනු නොලැබේ.

10. ***අයදුම් කළ යුතු ක්‍රමය :***

(*අ*) අයදුම්පත්‍රය මෙම නිවේදනයට අමුණා ඇති ආදර්ශ ආකෘතියට අනුකූල විය යුතු අතර, එය කඩදසියේ දෙපැත්ත භාවිතා කරමින් ඒ4 (A4) ප්‍රමාණයේ කඩදසියක, අයදුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 2.12 තෙක් පළමුවන පිටුවට ද, 3.0 සිට 5.0 තෙක් එහි දෙවන පිටුවට ද, ඉතිරිය තුන්වන පිටුවට ද, වන පරිද්දෙන් තම අයදුම්පත්‍රය සකස් කල යුතු බව විශේෂයෙන් සැලකිය යුතුය. මේ සඳහා පරිගණකයෙන් සකස් කරන ලද/යතුරු ලියනය කරන ලද අයදුම්පත් ද භාවිතා කල හැකිය. අයදුම්පත්‍රයේ සඳහන් තොරතුරු තම අත් අකුරෙන් ම පැහැදිලිව පිරවිය යුතු අතර ආදර්ශ අයදුම්පත්‍රයට අනුකූල නොවන අයදුම්පත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති අයදුම්පත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේ කරනු ලැබේ. අයදුම් පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් විය හැක. සම්පූර්ණ කරනු ලබන අයදුම්පත්‍රය මෙම විභාග නිවේදනයේ අවසානයේ දක්වෙන ආදර්ශ අයදුම් පත්‍රයට අනුකූල ද යන්න පිළිබඳව අයදුම්කරු විසින් විමසිලිමත් විය යුතු වේ. එසේ නොවුනහොත් එය ප්‍රතික්ෂේප විය හැකිය.

(*ආ*) අයැදුම්කරු විභාගයට පෙනී සිටීමට අපේක්ෂා කරන භාෂා මාධ්‍යයෙන් ම අයදුම්පත්‍රය සම්පූර්ණ කල යුතු ය. අයැදුම්පත්‍රය පිළියෙල කරගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහල භාෂාවට අමතරව ඉංග්‍රීයෙන් ද, දෙමළ අයැදුම්පත්‍රවල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදීම අත්‍යවශ්‍ය වේ.

(*ඇ*) විභාගය සඳහා වන නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපැලෙන් 2017.12.15 වැනි දින හෝ ඊට කලින් හෝ ලැබෙනු පිණිස එවිය යුතුය. අයදුම්පත් බහා ඇති ලිපි කවරයේ, වමත් පස ඉහළ කෙළවරේ පැහැදිලිව ''ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 02 සේවා ගණය සඳහා වන දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර තනතුරු සඳහා විවෘත ධාරාව යටතේ පුහුණු කාලසීමාවට සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය - 2017'' හා ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයෙන් හදරා ඇති පාඨමාලාව සහ වර්ෂය සඳහන් කළ යුතුය. එදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පතක් භාර ගනු නොලැබේ.

දුම්රිය සාමාන්‍යාධිකාරී,
ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව,
පත්වීම් ශාඛාව,
තැ. පෙ. 355,
ඕල්කොට් මාවත, කොළඹ 10.

(ඈ) අයදුම්පත්‍රයේ අයැදුම්කරුගේ අත්සන රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයකු, සාමදාන විනිශ්චයකරුවකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරී බලයලත් නිලධාරියෙකු, පොලිස් සේවයේ *ගැසට්* කල තනතුරක් දරන නිලධාරියෙකු හෝ රු. 240,360 කට වැඩි මූලික වාර්ෂික වැටුපක් ලබන රජයේ ස්ථිර තනතුරක් දරන මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ විසින් සහතික කරනු ලැබ තිබිය යුතුය.

(ඉ) සෑම ආකාරයකින්ම සම්පූර්ණ නොවන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තැපැල් කිරීමේ දී අයදුම්පත්‍රයක් නැතිවීම හෝ ප්‍රමාදවීම ගැන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ.

(ඊ) අයදුම්පත් ලද බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් දුම්රිය දෙපාර්තමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරනු ලැබේ. නිවේදනය පළ වී දින 2ක් හෝ 3 ක් ගත වූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ දුම්රිය සාමාන්‍යාධිකාරී කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. එසේ දැන්වීමේ දී අයදුම්කල විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ලිපිනය සහ ජාතික හැඳුනුම්පත් අංකය සඳහන් කළ යුතු ය. කොළඹින් බැහැර අයදුම්කරුවෙකු නම් එම විස්තර සමඟ ෆැක්ස් මඟින් ප්‍රවේශ පත්‍රයේ පිටපතක් එවීම සඳහා අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සටහන් කොට ඉල්ලීම් ලිපියක් නිවේදනයේ සඳහන් ෆැක්ස් අංකය මගින් දුම්රිය දෙපාර්තමේන්තුව වෙත යොමු කරමින් විමසීම වඩාත්, ඵලදායී වනු ඇත. තවද, දුම්රිය දෙපාර්තමේන්තුව විසින් ඉල්ලා සිටින අවශ්‍ය තොරතුරක් තහවුරු කිරීම සඳහා අයදුම්කරු විසින් ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තුවට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේ දී ලියාපදිංචි කරන ලද කුවිතාන්සිය ද සුදානමින් තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(උ) කිසියම් අයදුම්කරුවෙකු වෙත විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම ඔහු/ඇය විභාගයට පෙනී සිටීම සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

10. අයැදුම්කරුවන්ගේ අනන්‍යතාවය සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.
- පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත;
- වලංගු විදේශ ගමන් බලපත්‍රය.

11. මෙහි සඳහන් නොවන යම් කරුණක් වෙතොත් ඒ සම්බන්ධව දුම්රිය සාමාන්‍යාධිකාරී විසින් තීරණය කරනු ඇත. සියලුම අයැදුම් කරුවන් මෙම *ගැසට් පත්‍රයේ* සඳහන් පොදු විභාග නීතිරීති අනුව කටයුතු කිරීමට බැඳී සිටිනු ඇත. තවද සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළ වන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

එස්.එම්. අබේවික්‍රම,
දුම්රිය සාමාන්‍යාධිකාරී.

2017 නොවැම්බර් මස 10 වැනි දින.

ආදර්ශ අයදුම්පත

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

**ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවේ කළමනාකරණ සහකාර තාක්ෂණ බණ්ඩ - 02 සේවා ගණය සඳහා වන දුම්රිය තාක්ෂණික කළමනාකරණ සහකාර තනතුරු සඳහා විවෘත ධාරාව යටතේ පුහුණු කාලසීමාවට සුදුස්සන් තෝරා ගැනීමේ තරග විභාගය - 2017**

Open Competitive Examination for recruitment of Trainees of Railway Management Assistants (Technical) for Railway Management Assistant (Technical) Service Category - Section - 02 in Sri Lanka Railway Department - 2017

1.0 මාධ්‍යය :
විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදළ අංකය කොටුව තුල ලියන්න) අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ විභාගයට ඉදිරිපත්වන භාෂා මාධ්‍යයෙනි.)

2.0 පෞද්ගලික තොරතුරු :

2.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(උදා: HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

2.2 අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම :————.
(උදා : GUNAWARDHANA, H.M.S.K.)

2.3 සම්පූර්ණ නම : (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.4 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) : (ප්‍රවේශ පත්‍රය මෙම ලිපිනයට තැපැල් කරනු ලැබේ) :————.

2.5 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :————.

2.6 ස්ත්‍රී/ පුරුෂ භාවය : පුරුෂ - 0 අදාළ අංකය කොටුව තුළ ලියන්න ☐
ස්ත්‍රී - 1

2.7 ජාතික හැඳුනුම්පත් අංකය : ☐☐☐☐☐☐☐☐☐☐☐☐

2.8 විවාහක/අවිවාහක බව : අදාළ අංකය කොටුව තුළ ලියන්න

අවිවාහක - 1 ☐

විවාහක - 2

2.9 ජන වර්ගය : (සිංහල - 1, දෙමළ - 2, ඉන්දියන් දෙමළ - 3, මුස්ලිම් - 4, වෙනත් - 5) -

අදාළ අංකය කොටුව තුළ ලියන්න. ☐

2.10 උපන් දිනය : වර්ෂය ☐☐☐☐ මාසය : ☐☐ දිනය : ☐☐

2.11 සුදුසුකම් සැපිරිය යුතු 2017.12.15 දිනට වයස :

අවුරුදු : ☐☐ මාස : ☐☐ දින : ☐☐

2.12 දුරකථන අංකය : ☐☐☐☐☐☐☐☐☐☐

3.0 සුදුසුකම් :

3.1 අධ්‍යාපන සුදුසුකම් - අ.පො.ස. (සා.පෙළ)

වර්ෂය :————. විභාග අංකය :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. .................. | .................. |
| 2. .................. | .................. |
| 3. .................. | .................. |
| 4. .................. | .................. |
| 5. .................. | .................. |
| 6. .................. | .................. |
| 7. .................. | .................. |
| 8. .................. | .................. |

අ.පො.ස. (උ.පෙළ)

වර්ෂය :————. විභාග අංකය :————.

| විෂයය | සාමාර්ථය |
|---|---|
| 1. ……………… | ……………… |
| 2. ……………… | ……………… |
| 3. ……………… | ……………… |

3.2 ජර්මන් දුම්රිය කාර්මික අභ්‍යාස ආයතනයෙන් හදරා ඇති,

කාර්මික පාඨමාලාවේ නම :————.

පාඨමාලාවේ කාලය : වසර ☐

…………. දින සිට ………… දින දක්වා

4.0 මුදල් ගෙවූ මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපත මනා ලෙස අලවන්න.

| |
|---|
| මුදල් තැන්පතු පත්‍රිකාවේ (මුල් පිටපත) නොගැලවෙන ලෙස එහි එක් දරයක් මෙහි අලවන්න. (මුදල් තැන්පතු පත්‍රිකාවේ පිටපතෙහි ඡායා පිටපතක් ළඟ තබා ගන්න) |

5.0 අයදුම්කරුගේ සහතිකය :

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසය පරිදි සත්‍ය බවත්, විභාග ගාස්තු ගෙවන ලද අංක ……… හා ……… වැනි දින දරන මුදල් තැන්පතු පත්‍රිකාව මීට අලවා ඇති බවත් ප්‍රකාශ කරමි. විභාග නීතිරීතිවලට එකඟව ක්‍රියා කිරීමටත් මෙම විභාගය පිළිබඳ විධිවිධාන ඇතුළත් සේවා ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගිය හොත්, විභාගයට පෙර හෝ එය පවත්වද්දී හෝ ඉන් පසුව මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීම ගැනත් මම එකඟ වෙමි. තව ද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් දුම්රිය සාමාන්‍යාධිකාරීවරයා විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බව ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

6.0 අයදුම්කරුගේ අත්සන සහතික කිරීම (*ගැසට් නිවේදනයේ* 10 (ඈ) පරිදි විය යුතු ය.)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ……… (සම්පූර්ණ නම) යන අය මා පෞද්ගලිකව හඳුනන බවත්, නියමිත විභාග ගාස්තුව යොද ඇති බවත්, එම ලදුපත අලවා ඇති බවත්, ……… දින ඔහුගේ/ඇයගේ අත්සන මා ඉදිරියේ දී තැබූ බවත් මම සහතික කරමි.

————,
සහතික කර නිලධාරියාගේ අත්සන.

දිනය :————.
අත්සන සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය)

7.0 ආයතන ප්‍රධානියාගේ සහතිකය : (රාජ්‍ය/පළාත් රාජ්‍ය/රාජ්‍ය සංස්ථා සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන ....................... මයා/මිය/මෙනවිය මෙම අමාත්‍යාංශයේ/දෙපාර්තමේන්තුවේ/ආයතන ................. ලෙස සේවය කරන අතර ඔහුගේ/ඇයගේ අයදුම්පත්‍රය නිර්දේශකර ඉදිරිපත් කරමි. මෙම තනතුර සඳහා තෝරාගනු ලැබුවහොත් මෙම ආයතනයේ සේවයෙන් නිදහස් කිරීමට අවශ්‍ය කටයුතු සිදුකල හැකි ය.

————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම :————.
පදවි නාමය :————.
දිනය :————.
(නිල මුද්‍රාවකින් සනාථ කළ යුතු ය)

11-1218

---

## වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ වාරිමාර්ග කළමනාකරණ අංශයේ නේවාසික ව්‍යාපෘති කළමනාකරු තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017

වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ වාරිමාර්ග කළමනාකරණ අංශයේ නේවාසික ව්‍යාපෘති කළමනාකරු තනතුරු පුරප්පාඩු නවයක් (09) ක් බඳවා ගැනීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති ශ්‍රී ලාංකික පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම නිවේදනයේ අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය අනුව සම්පූර්ණ කරන ලද අයදුම්පත් 2018 ජනවාරි මස 08 වන දින හෝ ඊට පෙර ලැබෙන සේ ''අධ්‍යක්ෂ, වාරිමාර්ග කළමනාකරණ අංශය, වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල, බෞද්ධාලෝක මාවත, කොළඹ 07'' යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවරේ විභාගයේ නම සඳහන් විය යුතුය. අයදුම්පත්‍රයේ විභාගයේ නම සඳහන් කිරීමේ දී සිංහල අයදුම්පත්වල සිංහලට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද, දෙමළ අයදුම්පත්වල දෙමළ භාෂාවට අමතරව ඉංග්‍රීසි භාෂාවෙන් ද සඳහන් කළ යුතුය. සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් හා විභාග ගාස්තුවට අදාළ ලදුපතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇති බව ද දන්වමි.

විභාගය කොළඹ නගරයේ දී පවත්වනු ලැබේ. අයදුම්කරුවන් විසින් විභාග ගාස්තුව ලෙස රු. 1200.00 ක් විභාග කොමාසාරිස් ජනරාල් ගේ ආදායම් ශීර්ෂ 2003-02-13 ට බැර වන ලෙස දිවයිනේ ඕනෑම තැපැල්/උප තැපැල් කාර්යාලයකට ගෙවා ලබා ගන්නා ලද ලදුපත අයදුම්පතේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ ඇලවිය යුතුය. ගෙවන ලද ගාස්තුව මොනම හේතුවක් නිසාවත් ආපසු ගෙවීමෙන් හෝ වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් නොකරනු ලබන අතර, විභාග ගාස්තුව සඳහා මුදල් ඇණවුම් හෝ මුද්දර භාරගනු නොලැබේ.

01. *බඳවා ගැනීමේ ක්‍රමය* : මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති අයදුම්කරුවන්ගෙන් විවෘත ධාරාවෙන් 30% ක් ද, සීමිත ධාරාවෙන් 70% ක් ද බඳවා ගැනේ. මේ සඳහා ලිඛිත විභාග යක් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයක් පැවැත්වේ.

(*අ*) විවෘත බඳවා ගැනීම : බඳවා ගන්නා ශ්‍රේණිය III ශ්‍රේණිය

(*ආ*) සුදුසුකම් : විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්වවිද්‍යාලයක කළමනාකරණය, ආර්ථික විද්‍යාව, ඉංජිනේරු විද්‍යාව, කෘෂි විද්‍යාව සමාජ විද්‍යාව, භූගෙ ෘල විද්‍යාව, රාජ්‍ය පරිපාලනය, වාණිජ්‍යය, සංඛ්‍යානය, තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය යන විෂයයන් ගෙන් එකක් හෝ වැඩි ගණනක් ඇතුළත් උපාධියක් ලබා තිබීම.

(ඇ) *බඳවා ගැනීමේ ක්‍රමය* : ලිඛිත විභාගයකින් හා සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණයකින් බඳවා ගනු ලැබේ.

02. *කායික සුදුසුකම්* : සෑම අපේක්ෂකයෙකුම ශ්‍රී ලංකාවේ ඕනෑම ප්‍රදේශයක නේවාසිකව සේවය කිරීමටත්, තනතුරේ රාජකාරි ඉටු කිරීමටත් ප්‍රමාණවත් ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතු ය.

(*අ*) *වෙනත් සුදුසුකම්* :

(i) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතු ය.
(ii) අයදුම්කරුවන් විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු ය.
(iii) තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය සියලු සුදුසුකම් සම්පූර්ණ කළ යුතු බවට අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ/*ගැසට් පත්‍රයේ* සඳහන් වන දිනට එම සුදුසුකම් සෑම ආකාරයකින්ම සම්පූර්ණ කර තිබිය යුතු ය.

(*ආ*) තෝරා ගන්නා අයදුම්කරුවන් මන්නාරම, ත්‍රිකුණාමලය, අනුරාධපුරය, පුත්තලම, පොළොන්නරුව, අම්පාර, කුරුණෑගල, බදුල්ල, මහනුවර, හම්බන්තොට, මොණරාගල, හා මාතලේ යන දිස්ත්‍රික්කවල පිහිටි මහා වාරිමාර්ග ව්‍යාපාරවල, නේවාසික ව්‍යාපාර කළමනාකරණ

කාර්යාලවලින් ඕනෑම එකක සේවයේ යොදවනු ලබන අතර, රජයේ අවශ්‍යතාවය පරිදි මෙම ආයතනයේ කටයුතු මෙහෙයවනු ලබන වෙනත් දිස්ත්‍රික්කවලට ද සේවයේ අවශ්‍යතාවය අනුව යෙදවේ.

03. *වයස* : අවුරුදු 22 ට නොඅඩු හා අවුරුදු 35 ට නොවැඩි විය යුතුය. (ඒ අනුව 1995.05.30 දිනට හෝ ඊට පෙර හා 1982.05.30 දිනට හෝ ඊට පසු උපන් දිනය යෙදී ඇති අයට පමණක් මේ සඳහා අයදුම් කිරීමට සුදුසුකම් ඇත.)

04. *ලිඛිත විභාගය* : විභාග කොමසාරිස් ජනරාල් විසින් හෝ රාජ්‍ය සේවා කොමිෂන් සභාව අනුමත කරනු ලබන ආයතනයක් මගින් විභාගය පවත්වනු ලැබේ.

(අ) ලිඛිත විභාගය බුද්ධි පරීක්ෂණය, අවබෝධය හා පොදු ප්‍රශ්න පත්‍රයකින් යුක්තවේ. ලබාගත යුතු අවම ලකුණු ප්‍රමාණය 40 කි.

| *විෂයයන්* | *කාලය* | *උපරිම ලකුණු ප්‍රමාණය* | *සමත් ලකුණු ප්‍රමාණය* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්‍ෂණය | පැය 01 | 100 | 40 |
| 2. අවබෝධය | පැය 02 | 100 | 40 |
| 3. පොදු පරීක්‍ෂණය | පැය 03 | 100 | 40 |

(ආ) ලිඛිත විභාගය සඳහා වන විෂය නිර්දේශය :

| *ප්‍රශ්න පත්‍රය* | *විෂය නිර්දේශය* |
|---|---|
| 01. බුද්ධි පරීක්ෂණය | අයදුම්කරුගේ සිතීමේ තර්කානුකූලභාවයත්, විශ්ලේෂණ හැකියාවත්, තීරණ ගැනීමේ ශක්තියත්, විනිශ්චය කිරීමත් සඳහා වූ ප්‍රශ්නවලින් යුක්තය. මෙය බහුවරණ හා කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 50 කින් යුක්ත වේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |
| 02. අවබෝධය | භාෂාමය හැකියාව හා යම් ඡේදයක් කියවා එය නිසි පරිදි තේරුම් ගැනීමේ හැකියාව පරික්ෂා කිරීම, දීර්ඝ ඡේදයන් නිසි අර්ථ දක්වෙන පරිදි සාරාංශගත කිරීම, ආදිය පිළිබඳව අයදුම්කරුගේ දැනුම පරීක්ෂා කෙරේ. මෙහි ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුවේ. |
| 03. පොදු ප්‍රශ්න පත්‍රය | මහා වාරිමාර්ග ව්‍යාපාරවල කෘෂිකාර්මික කටයුතු සැලසුම් කිරීම, ව්‍යාපෘති සැලසුම් කිරීම, ව්‍යාපෘති කළමනාකරණය, වාරිමාර්ග නීතිරීති, ශ්‍රීලංකාවේ වාරිමාර්ග ආශ්‍රිත සංවර්ධන ව්‍යාපෘති පිළිබඳ හා ශ්‍රී ලංකාවේ වාරිමාර්ග ජල හා කෘෂිකාර්මික ප්‍රතිපත්ති පිළිබඳ දැනුම පරීක්ෂා කෙරේ. ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සැපයිය යුතුය. |

(ඇ) *සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය* : තරග විභාගයේ උපරිම ලකුණු ලබාගත් අයදුම්කරුවන් අතරින්—

පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. එහිදී අයදුම්කරුවන්ගේ මූලික සුදුසුකම්, සහතික හා ශාරීරික යෝග්‍යතාවය ආදිය පරීක්ෂා කිරීම පමණක් කරනු ලැබේ. ලකුණු ලබා දෙනු නොලැබේ. සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණ මණ්ඩලය පත් කරනු ලබන්නේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසිනි.

05. අයදුම්පත් කැඳවීමේ ක්‍රමය : රජයේ *ගැසට් පත්‍රයේ* දැන්වීම හෝ ප්‍රසිද්ධ පුවත්පත් දැන්වීම පළකිරීම සහ වෙබ් අඩවියේ පළකිරීම මගින් අයදුම්පත් කැඳවනු ලැබේ.

06. *ගැසට් නිවේදනයේ* සඳහන් සුදුසුකම් ඇති අය පමණක් ඉල්ලුම් කර ඇතැයි යන පූර්ව නිගමනය මත නිවේදනයේ සඳහන් වයස් සීමාව තුළවන, අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට හෝ එදිනට පෙර නියමිත විභාග ගාස්තුව ගෙවා ඊට අදළ ලදුපත සමග නිවැරදිව සම්පූර්ණ කරන ලද අයදුම්පත් යොමු කොට ඇති අයදුම්කරුවන් වෙත විභාග කොමසාරිස් ජනරාල් විසින් විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කරනු ඇත. විභාග ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 02ක් හෝ 03 ක් ගත වූ පසුවත් තම ප්‍රවේශ පත්‍රය නොලද අපේක්ෂකයෙක් වේ නම් දැන්වීමේ සඳහන් පරිදි ඒ පිළිබඳව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ සංවිධාන හා විදේශ විභාග ශාඛාවෙන් විමසිය යුතුය. එසේ විමසීමේදී අයදුම්කරු තමා ඉල්ලුම් කරන ලද විභාගයේ නම, අයදුම්කරුගේ සම්පූර්ණ නම, ජාතික හැඳුනුම්පත් අංකය හා ලිපිනය නිවැරදිව සඳහන් කළ යුතුය. අයදුම්කරු කොළඹින් බැහැර පදිංචිකරුවකු නම් එම විස්තරය සමඟ, ෆැක්ස් මගින් විභාග ප්‍රවේශ පත්‍රයේ පිටපතක් කඩිනමින් ලබා ගැනීමට හැකි අයදුම්කරුගේ ෆැක්ස් අංකයක් ද සඳහන් කරමින් ඉල්ලීම් ලිපියක් දැන්වීමේ සඳහන් ෆැක්ස් අංකය වෙත යොමු කරමින්ම විමසා සිටීම වඩාත් එලදයී වනු ඇත. එසේ විමසීමේදී විභාග දෙපාර්තමේන්තුව විසින් විමසා සිටින කිසියම් තොරතුරක් සනාථ කිරීම සඳහා තමා ළඟ තබාගත් අයදුම්පත්‍රයේ පිටපත, විභාග ගාස්තු ගෙවීමෙන් ලද ලදුපතෙහි පිටපත/විභාග ගාස්තු ගෙවීම අදළ නම් ඊට අදළ ලදුපතේ පිටපත හා අයදුම්පත්‍රය තැපැල් කිරීමේදී ලියාපදිංචි කළ කුවිතාන්සිය සූදනමින් තබාගැනීම ද ප්‍රයෝජනවත් වනු ඇත.

6.1 අයදුම්කරුවකුට විභාග ප්‍රවේශ පත්‍රයක් නිකුත් කිරීම, ඔහු හෝ ඇය විභාගයට ඉදිරිපත් වීමට සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස නොසැලකිය යුතුය.

07. *අනන්‍යතාවය* ඃ

(අ) පුද්ගලයින් ලියා පදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද ජාතික හැඳුනුම්පත

(ආ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

08. අයදුම්පත්‍රයේ ද විභාගය සඳහා වන ප්‍රවේශ පත්‍රයේ ද අයදුම්කරුගේ අත්සන සහතික කර තිබිය යුතුය. කිසියම් ආයතනයකින් විභාගයට අයදුම්කරන අයදුම්කරුවකු තම අත්සන ආයතන ප්‍රධානියා හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු ලවා ද, එසේ නොවන අයදුම්කරුවකු තම අත්සන රජයේ පාසලක ප්‍රධානියකු/විශ්‍රාමික නිලධාරියෙකු, කොට්ඨාසයේ ග්‍රාම නිලධාරිවරයෙකු, සමදාන විනිශ්වයකාරවරයකු, දිවුරුම් කොමසාරිස්වරයකු, නීතිඥවරයකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරිලත් නිලධාරියෙකු, රු. 240,360/- ක් හෝ ඊට වැඩි හෝ වාර්ෂික ඒකාබද්ධ වැටුපක් ලබන රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු හෝ බෞද්ධ විහාරස්ථානයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ නමක් හෝ අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්වයක් දරන අයකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

8.1 විභාගයට පෙනී සිටින දිනයේ ම විභාග ශාලාධිපති වෙත තම අත්සන සහතික කරවාගත් ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.

09. සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි හා සේවා කොන්දේසි ඃ

(අ) මෙම තනතුර ස්ථිර ය. විශ්‍රාම වැටුප් සහිත ය. වැන්දඹු හා අනත්දරු/වැන්දඹු පුරුෂ හා අනත් දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.

(ආ) පත්වීම අවුරුදු තුනක (03) පරිවාස කාලයකට යටත් වේ.

(ඇ) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 01/2014 හා ඊට අනුශාංගික චක්‍ර ලේඛ අනුව අදළ මට්ටමේ භාෂා ප්‍රවීණතාවය නියමිත කාලය තුළ ලබාගත යුතු අතර, රාජ්‍ය භාෂාවක් නොවන භාෂා මාධ්‍යයකින් සේවයට බැඳුණු නිලධරයන් විසින් නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතාවය පරිවාස කාලය තුළ ලබා ගත යුතු ය.

10. *වැටුප් පරිමාණය* ඃ රු. 47,615 - 10 x 1,335 - 8 x 1,630 - 17 x 2,170 - 110,895 ක් වන අතර, එම වැටුප ඔබට හිමි වන්නේ 2020.01.01 දින සිටය. රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 3/2016 හි උපලේඛන II හි විධි විධාන පරිදි පත්වීම ක්‍රියාත්මක වන දින සිට ඔබට වැටුප් ගෙවනු ලැබේ.

11.

11.1 සාමාන්‍ය සම්මුඛ පරීක්ෂණය ඃ
ලිඛිත පරීක්ෂණයේ එක් එක් විෂයෙන් ලකුණු 40% කට නොඅඩුව ලබාගන්නා අයදුම්කරුවන් අතුරින් මුළු ලකුණු කුසලතාවය අනුව පුරප්පාඩු සංඛ්‍යාවට සමාන සංඛ්‍යාවක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

11.2

විභාග ප්‍රතිඵල ඃ
ලිඛිත පරීක්ෂණයේ ප්‍රතිඵල මත සුදුසුකම් ලැබූ අයදුම්කරුවන්ගේ ලේඛනය වාරිමාර්ග කළමනාකරණ අංශයේ අධ්‍යක්ෂ වෙත ලබාදීමෙන් අනතුරුව විභාගයට පෙනීසිටි සියළුම අයදුම්කරුවන් වෙත ප්‍රතිඵල පෞද්ගලිකව ලබාදීමට හෝ ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ www.results. exams, gov.lk වෙබ් අඩවියේ ප්‍රසිද්ධ කිරීමට කටයුතු කරනු ඇත.

11.3 විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අයදුම්කරුවන් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුමකට යටත්වීමට ඔහුට හෝ ඇයට සිදුවනු ඇත.

12. සෑම පත්වීමක් සම්බන්ධයෙන් ම රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අංක 1589/30 හා 2009.02.20 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශිත කාර්ය පටිපාටික රීතිවල දක්වෙන පොදු කොන්දේසි, ආයතන සංග්‍රහයේ විධිවිධාන හා මුදල් රෙගුලාසි අදළ වේ.

13. මෙම බඳවා ගැනීමේ පරිපාටියේ විධි විධානවලට පරිබාහිර වූ කරුණු පිළිබඳ තීරණ රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ගනු ඇත.

14. සිංහල, දෙමළ හා ඉංග්‍රීසි මාධ්‍යයන්ගෙන් පළවන මෙම නිවේදනයේ භාෂා පාඨ අතර, කිසියම් නොගැලපීමක් හෝ අනනුකූලතාවයක් ඇති බව පෙනී යන්නේ නම් එවැනි අවස්ථාවක සිංහල මාධ්‍ය නිවේදනයට අනුව කටයුතු කරනු ලැබේ.

15. විභාගය පැවැත්වෙන්නේ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණකි. ඉල්ලුම් කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ.

චන්ද්‍රිකා වී. ඇතුගල,
අධ්‍යක්ෂ,
වාරිමාර්ග කළමනාකරණ අංශය.

2017 නොවැම්බර් මස 16 වැනි දින,
වාරිමාර්ග දෙපාර්තමේන්තු ගොඩනැගිල්ල,
බෞද්ධාලෝක මාවත,
කොළඹ 07.

### ආදර්ශ අයදුම්පත්‍රය

**වාරිමාර්ග හා ජලසම්පත් කළමනාකරණ අමාත්‍යාංශයේ වාරිමාර්ග කළමනාකරණ අංශයේ නේවාසික ව්‍යාපෘති කළමනාකරු තනතුරේ III ශ්‍රේණියට බඳවා ගැනීමේ විවෘත තරග විභාගය - 2017**

Open Competitive Examination - 2017 for recruitment of officers for the Post of "Resident Project Manager" of the Irrigation Management Division (IMD) of Ministry of Irrigation and Water Resources Management.

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
(අදල අංකය කොටුව තුළ ලියන්න)

01. (අ) මුලකුරු සමග නම (Mr./Mrs./Miss) :————.
(උදා : GUNAWARDHANA, H. M. S. K. (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :————.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ඇ) මුලකුරු සමග නම :————. (මයා/මිය/මෙනවිය)
(සිංහලෙන්/දෙමළෙන්)

02. (i) ස්ථිර ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.
(ii) ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය : (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :————.

03. ජාතික හැඳුනුම්පත් අංකය

04. ස්ත්‍රී/පුරුෂ භාවය : (ස්ත්‍රී - 1, පුරුෂ - 0)
අදල අංකය කොටුව තුළ ලියන්න

05. උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

06. අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට වයස :

අවු. : මාස : දින :

07. විවාහක/අවිවාහක බව :

අවිවාහක -1

විවාහක -2

(අදල අංකය කොටුව තුළ ලියන්න)

08. (i) ලබා ඇති උපාධිය හා වර්ෂය :————.
(ii) සාමාර්ථයේ ස්වභාවය : සාමාන්‍ය/I පන්තිය/II පන්තිය(ඉහළ/පහළ)
විශේෂ ගෞරව I පන්තිය/II පන්තිය (ඉහළ/පහළ)
(iii) අදළ විෂයයන් :————.

09. විභාග ගාස්තු :
(i) ගෙවන තැපැල්/උප තැපැල් කාර්යාලය :————.
(ii) ගෙවූ මුදල :————.
(iii) ගෙවූ දිනය :————.
(iv) ලදුපත් අංකය :————.

ලදුපත එක දරයකින් නොගැලවෙන සේ මෙහි අලවන්න. (ලදු පතේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.)

ඉහත දක්වා ඇති විස්තර සත්‍ය හා නිවැරදි බවත් ප්‍රකාශ කර සිටිමි. මා විසින් කරනු ලැබ ඇති ප්‍රකාශය අසත්‍ය බව පසුව අනාවරණය වුවහොත් සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවත් දන සිටිමි. ඉහතින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත්, මෙම විභාගය පැවැත්වීම හා ප්‍රතිඵල නිකුත් කිරීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීති රීතිවලට මම එකඟ වන බවත් ප්‍රකාශ කරමි.

————,
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :————.

10. අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ………………… මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවද, ඔහු/ඇය මා ඉදිරිපිටදී ……… දින ඔහුගේ/ඇයගේ අත්සන තැබූ බවද, නියමිත විභාග ගාස්තු ගෙවා ඇති බවද, එම ලදුපත අලවා ඇති බවද සහතික කරමි.

————,
අත්සන සහතික කරන නිලධාරියාගේ අත්සන.

දිනය :————.
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :————.
තනතුර :————.
ලිපිනය :————.
(නිල මුද්‍රාවෙන් සනාථ කරන්න)
(අනවශ්‍ය වචන කපා හරින්න)

11-1453

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.